# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

# 1987 අංක 6 දරන
# බෙදුම් නඩු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1987 ජනවාරි මස 30 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1987 ජනවාරි මස 30 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ : ශත 30 යි | තැපැල් ගාස්තුව : ශත 75 යි

# 1987 අංක 6 දරන බෙදුම් නඩු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1987 ජනවාරි මස 30 වන දින.]

එල්. ඩී.—ඕ. 50/85.

## ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 21 දරන බෙදුම් නඩු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 1987 අංක 6 දරන බෙදුම් නඩු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. කෙටි නාමය.

2. ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 21 දරන බෙදුම් නඩු පනතේ 73 වන වගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය මෙයින් ආදේශ කරනු ලැබේ:— ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 21 දරන පනතේ 73 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

“ මිනින්දෝරුවරයන්ගේ ලේඛනය.

73. (1) බෙදුම් නඩුවක් විභාග කිරීම සඳහා අධිකරණ බලය ඇති සෑම අධිකරණයක් විසින් ම, මේ පනත යටතේ අධිකාර පත්‍ර නිකුත් කරනු ලැබිය හැක්කා වූ ද, ඒ අධිකරණයේ අධිකරණ බලසීමාව තුළ පදිංචිව සිටින්නා වූ හෝ වෘත්තියෙහි යෙදී සිටින්නා වූ ද මිනින්දෝරුවරයන්ගේ ලේඛනයක් කලින් කල පිළියෙල කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පිළියෙල කරනු ලබන ලේඛනයෙහි මිනින්දෝරුවරයකුගේ නාමය ඇතුළත් කිරීමට පෙර, ඒ අධිකරණය විසින් නිකුත් කරනු ලබන අධිකාර පත්‍ර ක්‍රියාත්මක කිරීම සඳහා ඒ මිනින්දෝරුවරයාගේ සේවය නිතිපතා ලබා ගැනීමට හැකිවේදැයි නිශ්චය කොට දැනගැනීම සඳහා අවශ්‍ය විමසීම් ඒ අධිකරණය විසින් කරනු ලැබිය යුතු ය.”.

ඒ 092863—7,225 (86/09)

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත් වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.